- **ශ්‍රේණිය** - 8ශ්‍රේණිය - පලවන වාරය
- **නිපුණතාවය 4.0** - ශ්‍රී ලාංකේය සංස්කෘතිය හා සබැදි ගායනාවල පසුබිම අධ්‍යයනය කරමින් ගායනා කුසලතා ප්‍රදර්ශනය කරයි.
- **නිපුණතා මට්ටම 4.1** - නිර්දේශිත ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම හදුනා ගනිමු.
- **ක්‍රියාකාරකම 4.1.1** - ජන ගායනා වල සමාජීය හා සංස්කෘතික පසුබිම හදුනා ගනිමු. (වන්නම්,සිරස පාද,පතුරු,සවරං කවි)






සැකසුම :- සමන්ති පුණ්‍යවර්ධන
මප/වත්/මහනුවර ආදර්ශ විදුහල
පොල්ගොල්ල

මෙහෙයවීම :- නර්තන අංශය
වත්තේගම අධ්‍යාපන කලාපය

උපදෙස් :- මෙය ලිඛිත පාඩමකි.මෙම පාඩම වැඩිදුරටත් අධ්‍යනය කිරිම සඳහා

## හැඳින්වීම

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ :-

- අදාළ ජන ගායනාවල සමාජීය හා සංස්කෘතික පසුබිම හදුනා ගැනීම.
- අදාළ ගායනා රචනා වීමට හේතු සහ භාෂාත්මක විග්‍රහය පිළිබඳ පැහැදිලි කිරීම.
- අදාල ගායනා භාවිතයට ගන්නා අවස්ථා නම් කිරීම.

ඉහත කරුණු අධ්‍යයනය සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම්වල නිරත වෙමු.

## ක්‍රියාකාරකම

**පියවර 01 :-**

"ඇත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ

මෑත සිටන් එන්නි සෙල්ලි සෙල්ලියේ "







තිසලි,තිසලි,අර බලන්නකෝ සතාරා කවි කිය කියා කුල්ල අරන් නටන හැටි.......

අන්න පොළනවා.අන්න බැත එකතු කරනවා.

අයියෝ.........නෙත්මි,කෑ ගහන්න එපා.පාඩුවේ පෙරහැර බලන්නකෝ.......

තිසලි,ඒ නැටුමට කියන කවි ලස්සනයි නේද?

ඔව් ඔව් නෙත්මි, අැයි ඔයාට මතක නැද්ද? අපි 7 පන්තියේදී කුළු කවි ගායනා කලා.

තිසලි,හෙට අපිට ඉස්කෝලේ නැටුම් තියනවා නේද?...... ඔව්, ඔව් ,අපිට අළුත් ජන කවි පාඩමක් කියලා දෙනවා කිව්වා.ඒ අනුව අද අපි මෙම පාඩමෙන් සිරස පාද කවි,පතුරු නැටුම් කවි,සවරං කවි ගායනා මෙන්ම වෛරොඩි වන්නම ගැනත් අධ්‍යයනය කරමු.

**පියවර 02 :- නියමිත ජන ගායනා හඳුනා ගනිමු.**

- විවිධ ජීවන වෘත්තීන් වල ජීවත්වන ජන සමූහයාගේ විවිධ අවශ්‍යතාවන් සඳහා ජන ගායනා යොදාගෙන ඇති බව ඉහත පාඩම් වලදී අප ඉගෙනගෙන ඇත.
- එම ජන ගායනා රැසක් අතරින් අප මෙහිදී සාකච්ඡා කරනුයේ සිරස පාද කවි,සවරං කවි හා වන්නම් පිළිබඳවය.

**පියවර 03 :- ජන ගායනා භාවිතයට ගන්නා අවස්ථා හඳුනා ගැනීම.**



පියවර 04 :- සිරස පාද කවි හඳුනා ගනිමු.

සොළසා සංඛය පළමුව පෙරුම් පිරූ බලයෙන්දා
මෙලෙස මුනිදා වජ්‍රාසන වැඩහිඳ කෙලෙසුන් බින්දා
කලස රැගෙන මිහිකත දෙස් කී අනුහස් බලයෙන්දා
සිරස නළල පැමිණී දෝස දුරලන් මුනි බලයෙන්දා

එදා නිරිඳු සදා කළිඟු මැදා නුවර සාගතයක් වැදුනේ
ලදා කුමරු බැදා දෙමින් විදා වියරු වැද කුල්මත් වෙමිනේ
එදා ගිජිඳු සදා දුන්නු සදා කළිඟු නිරිඳුට සන්තොසිනේ
මුදා රෝග සිදා හරින් වැදූ සියලු පිරිපත හිස් මුදුනේ

පියවර 05 :- සිරස පාද කවි වල සංස්කෘතික පසුබිම

- අතුරායාගේ හිසේ සිට පාදාන්තය දක්වා වැළඳී ඇති සියලූම දොස් දුරු කිරීමට මෙම කවි ගායනය කරයි.
- සෙත් ශාන්තියක් ලගා කර දීමට මෙම කවි ගායනය කරයි.
- සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහිම ශාන්තිකර්ම වලදී මෙම කවි ගායනය කරයි.




- එක් එක් සම්ප්‍රදායන්ට අනුව නාද මාලාවේ වෙනස්කම් දැකිය හැකිය.
- මෙම කවි මාත්‍රා 3+3 (මැදුම් තනි තිත) තාලයට ගායනය කල හැකිය.

## පියවර 06 :- පතුරු කවි හඳුනා ගනිමු.







සූරිය කුල ඇති හිරු දෙවියන්ගේ
පැවිය අණසක ලොව පවතින්නේ
කාරිය කරවා පහදා දෙන්නේ
පතුරු නැටීමට අවසර දෙන්නේ

ලොව සෙත් කරවන පත්තිනි සදිනේ
සළුවක් අරගෙන සළු සලමින්නේ
වෙනසක් නොසිතා මගෙ ගුරුවරුගේ
පතුරක් අරගෙන රගනෙමු නොසිතේ

පියවර 07 :-  පතුරු නැටුම් හා සබැදි ගායනා වල සංස්කෘතික පසුබිම

- පතුරු නැටුම් කවි විවිධ නාදමාලා අනුව ගායනය කළ හැකිය.
- විවිධ තාල රටා මේ සඳහා යොදාගෙන අ◌ැත.
- කවි වල ඇති සංස්කෘතික වටිනාකම නාද මාලාවෙන් අ◌ාරක්ෂා වී ඇත.




- එම කවි වලින් ඉහත කරුණු සනාථ වේ.

පියවර 08 :- සවරං කවි හඳුනා ගනිමු.





පැවිය ගල් රැහැන් ජය රැස් වඩින්නට
වීරිය කර සිතින් ගනදුරු හරින්නට
කාරිය තමයි සවරං ගෙන රගන්නට
සූරිය දෙවි රජුනි අවසර දෙවන් මට

කවිය මාත්‍රා 3 තනි තිතට ගායනය කළ හැකිය

මල් ගවසාලා කොණ්ඩය බැඳලා
ඉණ තද කර සළු පැලඳ ගෙනේ
පියයුරු නිමලා එන ළැම උදුලා
සළු පටකින් වසමින් යසිනේ

මෙම කවිය මාත්‍රා 3 තනි තිතට ගායනය කළ හැකිය

පියවර 09 :- සවරං කවි ගායනා වල සංස්කෘතික පසුබිම

- මෙය ඉතා අලංකාර නැටුමකි.
- සවරං නැටුම,සවරං ලී දෙක දැතින් ගෙන කරකවමින් නර්තනයේ යෙදෙයි.
- එම කවි වලින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ කියවේ.
- සවරං නර්තනය කිරීමට පෙර සියලු දෙවියන්ගෙන් අවසර ගැනීමක් සිදුකරයි.
- මෙම සවරං කවි විනෝදාස්වාදය සඳහා නිර්මාණය වී ඇත.
- කාන්තාවන්ගේ ලාලිත්‍ය,ඔවුන් නැටුමට සැරසෙන ආකාරය මෙම කවි වල අන්තර්ගත වේ.
- සවරං කවි බෙර වාදනයට අනුව ගායනය කරයි.
- විවිධ නාද මාලා හා තාල රූප අනුව ගායනය කරයි.

## පියවර 10 :- වන්නම් වල සංස්කෘතික පසුබිම



- උඩරට සම්ප්‍රදායට අයත් වන්නම් අතර මාත්‍රා 3 තාල රූපයට වෛරොඩි වන්නම ගායනය කළ හැකිය.
- කෙහෙතු විමානය හා කෙහෙතු හා ඊශ්වර දෙවියන් අතර පැවති සංවාදය මැණිකකට උපමා කර ඇති බව කවි ගායනයෙන් පෙනේ.
- වන්නමේ තානම මගින් නාද මාලාව හඳුනාගත හැකිය.
- ගායනය අවග්‍රහයෙන්(තාලය වැදීමෙන් පසුව) ආරම්භ වීම මෙම ගායනයේ සුවිශේෂී ලක්ෂණයක් වේ.

## වෛරෝඩි වන්නම



### තානම :-

තනෙන තනෙන තනෙන තනා - තනෙන තනා තාතාතෙයි තනා

තාතාතෙයි තාතාතෙයි තාතාතෙයි තනා - තානත්තෙයි තන තම්දන තම්ද

නා තම්ද නා නා

### කවි :-

අගය වඩන කවි වරුණා
රගය දැනෙයි කළ රචනා
මට උරණා නොව මෙදිනා
මහතුගෙ අවසර රැගෙන සමාවා

ඉසුරු දෙවිඳු වඩින දිනා
කෙහෙතු විමන දැක නෙතිනා
එම විමනා දෙව් වඩිනා
කෙහෙතු ද දැක කොයි වඩිති කමාවා

විමන සමග කෙහෙතු දැනා
කවිය නැතිව බොරු වරුණා
එම වරුණා කළ යෙහෙනා
පාතල වෛරෝඩි වන්නම මේවා

ඔබින මෙසබ තුළ පැමිණා
ඉසුරු දෙවිඳු තුති දෙමිනා
කළ දුදනා නැත ඔබිනා
උගතුගෙ බල වැඩි මොකද පමාවා

මීට අමතරව,

- විශ්ණු දෙවියන්ගේ ගුණ වර්ණනා කිරීම සදහා ඊශ්වර කුණ්ඩ තාලය සිංදු වන්නම රචනා වී ඇත.
- මැදුම් තනි තිතට මෙම වන්නම ගායනය කරයි.

මීට අමතරව,

- වළි කුකුළකුගේ ගති ලක්ෂණ පිළිබදව කදම්භ පක්ෂි වන්නමෙන් කියවේ.
- මාත්‍රා 3 තනි තිතට අනුව ගායනය කල හැකිය.
- ගායන රටාවට වඩාත් උචිත වන පරිදි බෙර පදය සකස් වී තිබීම සුවිශේෂි ලක්ෂණයකි.
- ඉතාම ලයාන්විත නාද මාලාවකින් සමන්විත වේ.
- විලම්භ ලයෙන් ගායනය කරයි.
- අවග්‍රහයෙන් ගායන කිරීම මෙහිදී දැකිය හැක.